# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන)

**(122 වන අධිකාරය වූ) ඇටෝර්නි බලපත්‍ර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින්
2019 නොවැම්බර් මස 07 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2019 අගෝස්තු මස 27 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[308 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 17.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (122 වන අධිකාරය වූ) ඇටෝර්නි බලපත්‍ර ආඥාපනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ඇටෝර්නි බලපත්‍රය යන පදයේ අර්ථය පුළුල් කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, වගන්තියේ නීතිය බලපෑම වනුයේ වංචා වැළැක්වීමේ ආඥා පනතේ 2 වන වගන්තියේ විෂය පථය තුළට ගැනෙන යම් ගනුදෙනුවකට අදාළ ඇටෝර්නි බලපත්‍රය ලියාපදිංචි කිරීම අනිවාර්ය කිරීම වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට 3අ, 3ආ, 3ඇ සහ 3ඈ යන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, වංචා වැළැක්වීමේ ආඥා පනතේ විෂය පථය තුළට ගැනෙන යම් ගනුදෙනුවකට අදාළව ඇටෝර්නි බලපත්‍රය ලියාපදිංචි කිරීම සඳහා නව කාර්ය පටිපාටියක් නිශ්චිතව දක්වනු ලබයි.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම හෝ අහෝසි කිරීම සඳහා නව කාර්ය පටිපාටියක් නිශ්චිතව දක්වාලීම වේ.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය, 5 වන වගන්තියට කරනු ලැබූ සංශෝධනයට ආනුෂංගික වේ.

***7 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රඥප්තියට 11 වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, වගන්තියේ නීතිය බලපෑම වනුයේ ඇටෝර්නි බලපත්‍රයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් සපයනු ලැබූ සියලුම තොරතුරුවල රහස්‍යභාවය පවත්වා ගැනීමේ වගකීම ඇටෝර්නි බලපත්‍රය සහතික කරන්නා වූ යම් තැනැත්තකු හට ලබා දීම වේ.

***8 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය, I වන උපලේඛනය යනුවෙන් සංශෝධනය කරනු ලබන අතර, එය 9 වන වගන්තියෙන් කරනු ලැබූ සංශෝධනයට ආනුෂංගික වේ.

***9 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට නව II වන උපලේඛනය ඇතුළත් කරනු ලබන අතර, වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ඇටෝර්නි බලපත්‍රලාභියා නිසි පරිදි හඳුනා ගැනීම සඳහා අලුත් II වන උපලේඛනයක් ඇතුළත් කිරීම වේ.

***10 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් අන්තර්කාලීන විධිවිධාන සලස්වනු ලබන අතර, පරිච්ඡින්න කරනු ලැබූ විධිවිධානය යම් නිශ්චිත කාලසීමාවක් දක්වා අදාළ කරගනු ලැබීම සිදු කරනු ලබයි.

# ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන)

එල්. ඩී.— ඕ. 35/2016

## (122 වන අධිකාරය වූ ) ඇටෝර්නි බලපත්‍ර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2019 අංක දරන ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(122 වන අධිකාරය වූ) ඇටෝර්නි බලපත්‍ර ආඥාපනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ඇටෝර්නි බලපත්‍ර ආඥා පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ''ඇටෝර්නි බලපත්‍රය'' යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

'' ''ඇටෝර්නි බලපත්‍රය'' යන්නට යම් නීතිඥවරයකුට දෙන ලද ලිඛිත බලයක් හෝ අධිකාරයක් හැර, යම් කාර්යයක් ඉටු කිරීමට, ක්‍රියාවක් කිරීමට හෝ යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් හෝ කරගෙන යාම සඳහා එක් තැනැත්තකු විසින් තවත් තැනැත්තකුට දෙන ලද්ද වූ ද සාක්ෂිකරුවන් දෙදෙනකු ඉදිරියේ ලියා අත්සන් කරන ලද හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා, යම් විනිසුරුවරයකු හෝ මහෙස්ත්‍රාත්වරයකු, තානාපතිවරයකු, මහ කොමසාරිස්වරයකු හෝ 1981 අංක 4 දරන කොන්සල් කර්තව්‍ය පනතේ අර්ථය තුළට ගැනෙන යම් තානාපති නිලධරයකු හෝ කොන්සල් නිලධරයකු ඉදිරියේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ලියා අත්සන් කරන ලද ඇටෝර්නි බලපත්‍රයක් වන විට දී එකී රටේ නීතිය අනුව එවැනි ඇටෝර්නි බලපත්‍රයක් ලියා සහතික කිරීමට බලය ලබා ඇති යම් තැනැත්තකු ඉදිරියේ ලියා අත්සන් කරන ලද හෝ එවැන්නකු විසින් ලියා සහතික කරන ලද්ද වූ ද යම් ලිඛිත බලයක් හෝ අධිකාරයක් ඇතුළත් වේ;'';

(2) ''රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයා'' යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

'' ''රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයා''යන්නට, හිමිකම් රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයා, ඕනෑම නියෝජ්‍ය හෝ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු සහ රෙජිස්ට්‍රාර් - ජනරාල්වරයාගේ, හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ, නියෝජ්‍ය හෝ සහකාර රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයකුගේ කාර්යයන් තත්කාලයේ නීත්‍යානුකූලව ඉටු කරන ලබන යම් තැනැත්තකු ඇතුළත් විය යුතු ය;''.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

''ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීම.

3. (1) සිය ඇටෝර්නි බලපත්‍රය ලියාපදිංචි කිරීමට අපේක්ෂා කරන සෑම ඇටෝර්නි බලකරුවකු විසින් ම ස්වකීය ඇටෝර්නි බලපත්‍රය ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද පිටපතක් ද සමග එය ශ්‍රී ලංකාවේ දී ලියා අත්සන් කරන ලද්දක් නම්, ලියා අත්සන් කරන ලද දිනයේ සිට එක් මාසයක කාලයක් ඇතුළත ද එය ශ්‍රී ලංකාවෙන් පිටත දී ලියා අත්සන් කරන ලද්දක් නම්, ලියා අත්සන් කරන ලද දිනයේ සිට මාස තුනක කාලයක් ඇතුළත ද මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට අනුකූලව සකස් කරන ලදුව, ඔහුගේ දැනුම හා විශ්වාසයේ හැටියට එම ඇටෝර්නි බලපත්‍රය සත්‍ය හා බලාත්මක බවටත් ප්‍රදානකරු ජීවත් ව සිටින බවටත් වන දිවුරුම් ප්‍රකාශයක් ද සමග ලියාපදිංචි කිරීම සඳහා එම ඇටෝර්නි බලපත්‍රය රෙජිස්ට්‍රාර් - ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තියේ විෂය පථය තුළට ගැනෙන යම් ගණුදෙනුවක කාර්යය සඳහා භාවිත කිරීම පිණිස ප්‍රදානය කරනු ලබන සෑම ඇටෝර්නි බලපත්‍රයක් ම මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලබන ආකාරයට රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයා වෙත සහ අවස්ථාවෝචිත

පරිදි එම ඉඩම ලියාපදිංචි කරනු ලැබ ඇති අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත හෝ අදාළ හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා වෙත අවස්ථාවෝචිත වන පරිදි අදාළ වෙළුමේ සහ පත් ඉරුවේ හෝ 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ අදාළ හිමිකම් ලේඛනයේ ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ඇටෝර්නි බලපත්‍රයේ පිටපතෙහි නිරවද්‍යතාව පිළිබඳව රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයා තමා විසින් ම සෑහීමට පත්වීමෙන් අනතුරුව, ඇටෝර්නි බලපත්‍රය ලියාපදිංචි කර, එම පිටපත ගොනුකොට ඒ මත සහ ඇටෝර්නි බලපත්‍රය මත එහි ලියාපදිංචි අංකය සහ දිනය, එම ලියාපදිංචිය සටහන් කොට ඇති, අවස්ථාවෝචිත පරිදි පත් ඉරුව හා වෙළුමට හෝ හිමිකම් ලේඛනයට යොමුවක් සමඟ පිටසන් කොට එම ඇටෝර්නි බලපත්‍රය ඉදිරිපත් කරන ලද තැනැත්තා වෙත ම ආපසු භාරදිය යුතු ය.

(3) එවැනි ලියාපදිංචි කිරීමක් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට අනුකූලව පොතක සටහන් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 3අ, 3ආ, 3ඇ සහ 3ඈ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියට ඉක්බිතිව ම පහත අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම ප්‍රඥප්තියේ 3අ, 3ආ, 3ඇ සහ 3ඈ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:-

"වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තියේ විෂය පථය තුළට ගැනෙන ගණුදෙනුවල අරමුණු සඳහා භාවිතා කිරීම පිණිස ප්‍රදානය කරන ලද ඇටෝර්නි බලපත්‍රවල දී අනුගමනය කළ යුතු ඇතැම් අවශ්‍යතා.

3අ. වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තියේ විෂය පථය තුළට ගැනෙන ගණුදෙනුවල අරමුණ සඳහා භාවිතා කිරීම පිණිස ප්‍රදානය කරන ලද ඇටෝර්නි බලපත්‍රයක-

(අ) එම ඇටෝර්නි බලපත්‍රය ශ්‍රී ලංකාව තුළ ලියා අත්සන් කරන ලද අවස්ථාවක, නොතාරිස් ආඥාපනතට අනුකූලව ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් විධිමත් ලෙස සහතික කරනු ලැබිය යුතු අතර, ගණුදෙනුවට යෝජිත ඉඩමේ විස්තරයක්, මායිම් සහ සීමා සහ ප්‍රමාණය සහ සහාධිපත්‍ය දේපළක් වන විට දී ඒකකය හඳුනාගත හැකි අවස්ථාවක දී ඒකකයේ සහ අනෙකුත් අංගෝපාංගවල විස්තරයක් ද ඒකකය

හඳුනාගත නොහැකි අවස්ථාවක දී මුළු ඉඩම පිළිබඳ විස්තරයක් ද ගණුදෙනුවට යෝජිත ඉඩම හෝ සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කොට ඇත්නම් එසේ ලියාපදිංචි වී ඇති වෙළුම හා පත් ඉරුවට යොමුව ද අන්තර්ගත විය යුතු ය;

(ආ) එම ඇටෝර්නි බලපත්‍රය ශ්‍රී ලංකාවෙන් පිටත ලියා අත්සන් කරන ලද අවස්ථාවක, ඉඩමේ මායිම් සහ සීමා සහ ප්‍රමාණය සහිතව ඉඩමේ විස්තරයක් සහ සහාධිපත්‍ය දේපළක් වන විට දී, ඒකකය හඳුනාගත හැකි අවස්ථාවක දී එහි සහ අනෙකුත් අංගෝපාංගවල විස්තරයක් ද, ඒකකය හඳුනාගත නොහැකි අවස්ථාවක දී මුළු ඉඩම පිළිබඳ විස්තරයක් ද ගණුදෙනුවට යෝජිත ඉඩම හෝ සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කොට ඇත්නම් එසේ ලියාපදිංචි වී ඇති වෙළුම හා පත් ඉරුවට යොමුව ද අන්තර්ගත විය යුතු ය;

(ඇ) ප්‍රදානකරුගේ අත්සනට අමතරව ප්‍රදානකරුගේ වම් හෝ දකුණු මාපට ඇඟිලි සළකුණු සහ ප්‍රදානකරුගේ මාපට ඇඟිලි දෙකම නොමැති විට, ප්‍රදානකරුගේ වම් හෝ දකුණු අතේ කවර හෝ ඇඟිල්ලක සළකුණ දැරිය යුතු අතර, ඔහුගේ අත් දෙකම නොමැති අවස්ථාවක, ඔහුගේ කකුලේ මාපට ඇඟිලි සළකුණ ප්‍රසිද්ධ නොතාරිස්වරයා හෝ එම ඇටෝර්නි බලපත්‍රය සහතික කරනු ලබන වෙනත් තැනැත්තා සහ සාක්ෂිකරුවන් ඉදිරියේ තැබිය යුතු ය; සහ

(ඇ) ඇටෝර්නි බලපත්‍රය සහතික කරනු ලබන ප්‍රසිද්ධ නොතාරිස්වරයා විසින් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ලියා අත්සන් කරන ඇටෝර්නි බලපත්‍රයක් වන අවස්ථාවක දී එම ඇටෝර්නි බලපත්‍රය සහතික කරනු ලබන ප්‍රසිද්ධ නොතාරිස්වරයා හෝ වෙනත් එවැනි තැනැත්තකු හෝ විසින් සහතික කරන ලද ප්‍රදානකරුගේ සහ ඇටෝර්නි බලකරුගේ විදේශ ගමන් බලපත්‍රයේ හෝ ජාතික හැඳුනුම්පතේ පිටපතක් හෝ විදේශ ගමන් බලපත්‍රය හෝ ජාතික හැඳුනුම්පත නොමැති අවස්ථාවක දී ප්‍රදානකරුගේ සහ ඇටෝර්නි බලකරුගේ මෑත දී ගන්නා ලද මි.මී.3.5 x මි.මී.4.5 ප්‍රමාණයේ ඡායාරූපයක් ඇටෝර්නි බලපත්‍රයට අමුණා තිබිය යුතු ය.

**ප්‍රසිද්ධ නොතාරිස්වරයා විසින් ඇටෝර්නි බලපත්‍රය අවලංගු හෝ බලරහිත කරනු ලැබ ඇත්දැයි තහවුරු කර ගත යුතු බව.**

3ආ. ප්‍රදානකරුවකු විසින් දෙනු ලබන ඇටෝර්නි බලපත්‍රයක් මත, වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තියේ විෂය පථය තුළට ගැනෙන ගණුදෙනුවකට අදාළව, නොතාරිස් ආඥාපනතට අනුකූලව ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් සහතික කරන සෑම ප්‍රසිද්ධ නොතාරිස්වරයෙක් ම අවස්ථාවෝචිත පරිදි, අදාළ ඉඩම ලියාපදිංචි කර ඇති ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හෝ හිමිකම් ලේඛනයේ අදාළ වෙළුම් සහ පත්ඉරු අදාළ සටහන් සහ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ පත්ඉරු පරීක්ෂා කළ යුතු අතර ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර හෝ බලරහිත කර නොමැති බව තහවුරු කරගත් බව එම ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ ඔහුගේ සහතිකයේ සඳහන් කළ යුතු ය.

එවැනි ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කර හෝ බලරහිත කර තිබේ ද නැති ද යන්න නිශ්චය කිරීමේ කාර්යය සඳහා, එවැනි ගණුදෙනුවක් සහතික කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයකු රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයාගේ රෙජිස්ටරය සහ අවස්ථාවෝචිත පරිදි ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අදාළ පත්ඉරු සහ වෙළුම් හෝ හිමිකම් රෙජිස්ටරය පරීක්ෂා කිරීම ප්‍රමාණවත් විය යුතු ය.

ප්‍රසිද්ධ නොතාරිස්වරයා ඇටෝර්නි බලපත්‍රයේ පිටපතක් හා ප්‍රදානකරුගේ සහ ඇටෝර්නි බලකරුගේ විදේශ ගමන් බලපත්‍රයේ හෝ ජාතික හැඳුම්පතේ පිටපතක් තබා ගත යුතු බව.

3ඇ. 3අ වගන්තියේ සඳහන් ගණුදෙනුවකට අදාළ ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් ලියා සහතික කරන සෑම ප්‍රසිද්ධ නොතාරිස්වරයෙක් ම ඇටෝර්නි බලපත්‍රයේ ප්‍රදානකරුගේ සහ ඇටෝර්නි බලකරුගේ විදේශ ගමන් බලපත්‍රයේ හෝ ජාතික හැඳුම්පතෙහි පිටපතක් තබා ගත යුතු අතර විදේශ ගමන් බලපත්‍රය හෝ ජාතික හැඳුනුම්පත නොමැති විටක දී, 3අ (ඈ) වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි වන ඡායාරූපයක් සහ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රයේ සහතික කළ පිටපතක් තබා ගත යුතු ය.

ඇටෝර්නි බලපත්‍රයක වලංගු කාල සීමාව.

3ඈ. ඇටෝර්නි බලපත්‍රයක එහි වලංගු කාලසීමාව නිශ්චිතව සඳහන් කර ඇත්නම් හෝ 4 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව එම ඇටෝර්නි බලපත්‍රය බලරහිත හෝ අවලංගු කරනු ලැබ ඇත්නම් මිස ඇටෝර්නි බලපත්‍රයක් එහි සහතික කරන ලද දිනයේ සිට වසර පහක කාලසීමාවක් සඳහා වලංගු විය යුත්තේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීමේ හෝ බලරහිත කිරීමේ කාර්ය පටිපාටිය.

4. (1) යම් ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීමට හෝ බලරහිත කිරීමට එහි ප්‍රදානකරු අදහස් කරයි නම් හෝ එම ඇටෝර්නි බලපත්‍රය යටතේ ක්‍රියාකිරීමට ඇටෝර්නි බලකරු අදහස් නොකරයි නම්, එම ප්‍රදානකරු හෝ ඇටෝර්නි බලකරු අවස්ථාවෝචිත පරිදි, ඇටෝර්නි බලපත්‍රය බලරහිත කරමින් හෝ එම ඇටෝර්නි බලපත්‍රය යටතේ ක්‍රියා නොකිරීමට වන ඔහුගේ අදහස ප්‍රකාශ කරමින් ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් ලියා සහතික කරනු ලබන ලේඛනයක් සැකසිය යුත්තේ ය.

(2) එවැනි ප්‍රදානකරුවකු හෝ ඇටෝර්නි බලකරුවකු අවස්ථාවෝචිත පරිදි (1) වන උපවගන්තියේ දැක්වෙන ලේඛනය, රෙජිස්ට්‍රාර්-

ජනරාල්වරයා වෙත සහ එය වංචා වැලැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තියේ විෂය පථය තුළට ගැනෙන ගණුදෙනුවක අරමුණ සඳහා භාවිතා කරනු ලැබීමට ප්‍රදානය කරන ලද ඇටෝර්නි බලපත්‍රයකට අදාළ වේ නම් රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයා වෙත, සහ අවස්ථාවෝචිත පරිදි එම ඇටෝර්නි බලපත්‍රය ලියාපදිංචි කොට ඇති, අදාළ වෙළුමේ සහ පත් ඉරුවේ හෝ හිමිකම් ලේඛනයේ ලියාපදිංචි කිරීම සඳහා අවස්ථාවෝචිත පරිදි, එම ලේඛනය ලියාපදිංචි කරන ලද ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත හෝ හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා වෙත නොපමාව ඉදිරිපත් කළ යුත්තේ ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් එවැනි ලේඛනයක සත්‍ය පිටපතක් බවට ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද පිටපතක් අවස්ථාවෝචිත පරිදි අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම ඇටෝර්නි බලපත්‍රය ලියාපදිංචි වී ඇති වෙළුමේ සහ පත් ඉරුවේ හෝ අදාළ හිමිකම් ලේඛනයේ ලියාපදිංචි කළ යුතු ය.”.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ඉවත් කිරීම.**

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියට 11 වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.**

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට ඉක්බිතිව ම ඉහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

“ඇටෝර්නි බලපත්‍රයේ තොරතුරුවල රහස්‍යභාවය සුරැකීමේ වගකීම.

11. යම් ඇටෝර්නි බලපත්‍රයක් ලියා අත්සන් කරනු ලබන ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ යම් තැනැත්තකු එම ඇටෝර්නි බලපත්‍රය සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් ලබාදෙන ලද ඕනෑම තොරතුරක රහස්‍යභාවය සුරැකිය යුතු ය.”.

**ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය අංකනය කිරීම.**

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය එම ප්‍රඥප්තියේ I වන උපලේඛනය ලෙස මෙයින් අංකනය කරනු ලැබේ.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ I වන උපලේඛනය ලෙස අංකනය කරන ලද උපලේඛනයට ඉක්බිතිව ම පහත අලුත් උපලේඛනය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ II වන උපලේඛනය වශයෙන් බලාත්මක විය යුත්තේ ය:— ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් උපලේඛනයක් ඇතුළත් කිරීම.

"II වන උපලේඛනය (3 වන වගන්තිය)

........................................ පදිංචි ............................ වන මා විසින්.......................... භක්තිකයකු වශයෙන් පහත දැක්වෙන පරිදි මෙයින් දිවුරා/ප්‍රතිඥා දී ප්‍රකාශකර සිටිමි:-

(1) ඉහත සඳහන් දිවුරුම්/ප්‍රතිඥා ප්‍රකාශක මම වෙමි.

(2) මේ සමග අමුණා ඇති ඇටෝර්නි බලපත්‍රය සත්‍ය හා දැනට බලාත්මක ව පවතින ඇටෝර්නි බලපත්‍රයක් වන බවත් ප්‍රදානකරු ජීවත්ව සිටින බවට විශ්වාස කරන බවත් කියා සිටිමි.

ඉහත සඳහන් දිවුරුම් ප්‍රකාශය මෙහි නම් සඳහන් දිවුරුම් ප්‍රකාශක හට කියවා අවබෝධ කරදීමෙන් පසුව ඔහු විසින් ප්‍රතිඥා දී/දිවුරුම් දී/.................. දින.................. දී අත්සන් කරන ලදී.

.................................
ඇටෝර්නි බලකරු

මා ඉදිරිපිට දී ය.

.........................................
සාමදාන විනිශ්චයකාර/දිවුරුම් කොමසාරිස්.".

**10.** මෙම පනතේ 3 වන වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ඉවත් කිරීම නොසලකා එම වගන්තියේ විධිවිධාන, මෙම පනතේ ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ලියා සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. අන්තර්කාලීන විධිවිධාන.

**11.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.